# සතුන්ගේ රජා ගීර් වනයේ සිංහයෝ

මහාචාර්ය ලක්ෂ්මන් වෛද්‍යසේකර

**සතුන්ගේ රජා යනුවෙන් හඳුන්වන සිංහයා අපගේ කුතුහලය අවුස්සන සතෙකි. බළල් පවුලේ විශාල සාමාජිකයෙක් වන මෙම සතා සිටින බව අප දැන ගන්නේ සතාගේ මහා ගෙරවීම් හඬිනි. මෙය සිදුවන්නේ හිරු බැස යාමට පෙරය. දෙහිවල සත්තු වත්තට සැතපුමක් පමණ දුරින් පිහිටි අප නිවසට නිසංසල සැඳෑවක හිරු බැස යාමට කලින් මේ හඬ ඇසේ.**



මේ ක්‍රියාව මෙමසතුනගේ වනයේ ගහනය පහත බැසීමට හේතුවක් බව සත්ත්ව විද්‍යාඥයන්ගේ අදහසයි. පිරිමි සිංහයාගේ හිස ගෙල වටා සහ පපුව වටා විහිදී ඇති රෝම රොත්ත ද ගහන සීමාවට සාධකයක් බව කියයි. මෙම රෝම රොත්ත පපුව වටා ද විහිදී ඇත්තේ බාබරි සිංහයන්ගේ ය. අද අප්‍රිකාවේ සහ ආසියාවේ ජීවත්වන ආසියාතු සිංහයා ගුජරාට්හි ගීර් වනාන්තරයේ ජීවත්වෙයි. අද ගීර් වන සත්ත්ව අභය භූමියක් ලෙස සලකති. ගීර් පාතුක නැතහොත් පතනශීල වනයකි. එහි ගස්වලට අමතරව උස් තණකොළ සහ කුඩා පඳුරු ඇත. මේ පෙදෙසට ජූලි සිට නොවැම්බර් දක්වා තද වැසි ඇතිවේ. ශාක භක්ෂක සතුන්ද මේ වනයේ වතුර සොයා සැරිසරති.

වනසත්ත්ව අභය භූමියේ පර්යේෂණ පවත්වන අයට ආදල විශේෂ දෙය තම් අභය භූමියට අයිති එය අවට ජීවත්වන මිනිසුන් ගවයින් සහ ඔවුනගේ දෙආකාර පැවැත්ම ගැන ය. මෙම පර්යේෂණ වල විශේෂ තැනක් වූයේ 1968 වර්ෂයේ පර්යේෂණ කළ ජොස්ලින් නම් විද්වතාටය. ඊට පසු 1982 දී බාර්බේරියා නම් විද්‍යාඥයාගේ සියලු පර්යේෂණ සිංහයා සහ එම ප්‍රදේශයේ ජීවත්වන මිනිසුන් සහ ඇතිකරන ගවයන් ගැනය. මේ නිසා ගීර් සිංහයාගේ පැවැත්මට බාධා පැමිණීම අවම කර ගැනීමට වනජීවී අභය භූමියේ සිංහයන් ආරක්ෂා කිරීමේ අගනා මෙහෙවරකි. ගීර් අභයභූමියේ කළමනාකරණයේ වගකීම උඩ එහි ක්‍රියාකරන සැමගේම අරමුණ ලෝකයටම දයාදයක් වූ ගීර් සිංහයන් ආරක්ෂා කිරීමය.පරිසර පද්ධති අනුව විශේෂ විවිධත්වය යම් කිසි සමතුලිත භාවයකට සකස් කරවීම ඔවුනගේ අරමුණයි. නමුත් එක් බාධකයක්ව පවත්තේ ගීර් ජාතික වනය ප්‍රමාණයෙන් කුඩා නිසා ආසියාතික සිංහයා උගේ දඩයම සඳහා අවටද යොමුවන බව පෙනේ. එම නිසා මෙම ක්‍රියාවලියට බලපාන සාධක දැනට සෙයා බැලෙමින් පවතී. මෙහි කළමනාකරණයට ඇති වගකීම පරිසරවේදීන්ටත් බලපාන දෙයකි. සිංහයන්ගේ සංචරනය හා ගමනය මෙය විශාල ක්‍රියාවක් ලෙස යොද ගැනීමෙන් ගමෙහි ජීවත්වන මිනිසුන්ගේ හැසිරීමද සීමාකිරීම වටනේය. ඒ අයුරුම මෙහි ජීවත්වන අනිකුත් ශාකභක්ෂක ලොකු සතුනගේ ගහනයද වැඩිවීමද සීමා කළ යුතු ය. කෘෂිකර්මයට අහිතකර ගව වර්ග ද මෙයට බලපාන කොටසකි.

මෙහි ඇති පරිසර කළමනාකරණයද වැදගත් දෙයකි. පරිසරය අනුව ගීර් වනයෙහි වතුර තණකොළ දූව කුඩා දූව යනාදිය ජීවත්වන ගැමියන්ගේ අවශ්‍යතාවත්ය. පසෙහි ඇති සරුභාවයද ගැමියන්ට බලපාන දෙයකි. මෙය ජෛව විවිධත්වය කෙරෙහි බලපාන දේවල්ය. මෙහි ජීවත්වන ගැමියන් අනිකුත් වනජීවීන්ගේ අවශ්‍යතාවත් ද සැලකිල්ලට ගනී.

සිංහයා සහ අනිකුත් සතුන් ගැමියන්ගේ පද්ධතියට අවශ්‍ය දෙයක් ලෙස ඔවුහු සලකති. මෙම ප්‍රදේශයේ ජීවත්වන 1,60,000 පමණ ජනයාත් ඔවුන් අතර ඇති 1,25,000 පමණ ගවයින්ද දෙආකාරයෙන්ම ප්‍රයෝජනවත්ය. ගීර් වනය ඇසුරින් ජීවත්වන ගැමියෝ සතුන් කෙරෙහි ඉතා ඇල්මක් දක්වති. සතුන්ගේ ජීවත්වීමට උපකාරී වෙති. තම කෘෂි වගා විනාශය සහ අනිකුත් වෙනස් කම් තිබුණත් ඔවුහු ඔවුන්ගේ ස්වාධීනත්වයත් සතුන්ගේ ස්වාධීනත්වයත් දෙකම සලකන කොටසකි. එමනිසා ආසියාතික සිංහයා ඔවුනගේම කොටසක් ලෙස සලකති.

සිංහයන් ඉක්මනින් බලගතු විධියට සතුන් මැරීම සිදු නොකරයි. ඔවුනගේ ගොදුරට කරන බලපෑම පැත්තකින් හෝ පිටුපසින් විත් සිදුකරන්නේ ගොදුරේ පිටුපසට තම පිටුපස ගාත් දෙකෙන් සිටගෙන කර අල්ලා ගැනීමෙනි. ගොදුර පිටුපස හඹා යෑම සිදුකිරීම ඉතා අල්පය. පළමුව ;ගාදුරට ගන්නා සතාගේ ගෙලට පහරදී සිහිනැති කරයි. ගොදුර දිග හැරීමෙන් පසු වංශවත් භාවය රැකීමට අනිකුත් සිංහයන් ගෙන යයි. පසුව බෙරිහන් දීමෙන් පසු තවත් සගයන් ගෙන්වා ගනී. වංශවත් කොටසින් පලවා හරිනු ලැබ තැන තැන සැරිසරන සිංහයන් පැටවුන් සමග සිංහධේනුවන් වයස්ගත හා තුවාල ලැබුවන් ශාක භක්ෂක ලොකු සතුන් ගොදුරු කිරීමට නොහැකි සිංහයන් ගීර් ප්‍රදේශයේ ඇත.

මොවුන් වංශවත් කොටසින් වෙන්වූ අයයි. ගම් වැසියන් තමන්ට උපකාර කරන ගවයින් හැර වයස්ගත කිසිවක් උපයාගත නොහැකි ගවයින් අයාලේ යාමට අත්හරී. එමනිසා මේ සතුන් සැරිසරන සිංහයන්ට ආහාර වේ. වර්ෂා කාලයේදී වතුර ඇති තැන්වලට පැමිණෙන සතුන්ද ගොදුරට අයත් වේ.

සත්ත්ව ලෝකයේ රජා ලෙස සලකන සිංහයා හිරු බැස යනවිට බෙරිකන් දෙමින් හඬ නගන සිංහයා හිස පෙදෙසේ දික් රෝම සහිත පිරිමි සතෙකුගෙන්ද එවැන්නක් නැති ඉතා පියකරු ස්වභාවයක් ඇති සිංහ ධේනුවක් ඇති සත්ත්ව ලෝකයේ දයාදයක් ලෙස සැලකිය හැක. ආසියාවට ආවේණික වූ ගුජරාට් ගීර් වනයේ වෙසෙන සිංහයාට අප රටෙහි නිජ භූමියක් නැතත් අපේ සංස්කෘතියටත් හිමිකම්කියන සිංහයා ජෛව විවිධත්වයේ වටිනා පුරුකක් ලෙස පරිණාමය සත්ත්ව ලෝකයට ලබාදී ඇති මහඟු දයාදයකි. ❑